දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்லை.
"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. ........................................

මගේ අංකය / எமது இல. / My No. ඊඩී/2/29/3/9/1

දිනය / திகதி / Date 2004.11 23

චක්‍රලේඛ අංක :-2004/31

සියලු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,

**<u>රජයේ පාසල්වල ගුරුවරුන් වශයෙන් සේවය කරමින් සිටියදීම විශ්ව විද්‍යාලවල අභ්‍යන්තර ශිෂ්‍යයන් ලෙස උපාධි පාඨමාලා හදාරා උපාධි ලබා ගැනීම</u>**

රජයේ පාසල් වල සේවය කරන සමහර ගුරුවර ගුරුවරියන් විධිමත් ලෙස අධ්‍යයන නිවාඩු ලබා ගැනීමකින් තොරව විශ්ව විද්‍යාල වල අභ්‍යන්තර ශිෂ්‍යයන් ලෙස ලියාපදිංචි වී පාඨමාලා හැදෑරීම සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබ ඇති අංක 91/6 හා 1999/28 අමාත්‍යාංශ චක්‍රලේඛ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02.ගුරුවරුන් පූර්ණ කාලීන ගුරු සේවයේ යෙදිය යුතු පිරිසක් බැවින් ගුරු සේවයේ යෙදී සිටියදීම විශ්ව විද්‍යාලවල අභ්‍යන්තර ශිෂ්‍යයන් ලෙස පාඨමාලා හැදෑරීම නොකළ යුතු ක්‍රියාවක් බව නැවත වරක් අවධාරණය කරමි. අනවසරයෙන් විශ්ව විද්‍යාල වල අභ්‍යන්තර ශිෂ්‍යයන් ලෙස ලියා පදිංචි වී පාඨමාලා හැදෑරීම මගින් ඔවුන්ගෙන් ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ඉටුවිය යුතු යුතුකම් කොටස නිසිපරිදි ඉටු කිරීම කළ නොහැකි වේ.

03. විශ්ව විද්‍යාලවලට, අභ්‍යන්තර ශිෂ්‍යයින් ලෙස ලියාපදිංචි වී පාඨමාලා හැදෑරීම සඳහා විධිමත්ව අධ්‍යයන නිවාඩු අනුමත කරවා නොගෙන හා මුදා හරිනු නොලබන ගුරුවරුන්/ගුරුවරියන් සම්බන්ධයෙන් 2004-01-01 දිනෙන් පසුව උපාධි වැටුප් සකස් කරනු නොලබන බවද දන්වමි.

04.කෙසේ වුවද මේ වන විටත් කිසියම් ගුරුවරයෙක්/ගුරුවරියක් මෙසේ විශ්ව විද්‍යාලයකින් අභ්‍යන්තර උපාධියක් ලබා ගෙන තිබේ නම් එම අයට අදාළ උපාධි වැටුප් ලබා දීමට තීරණය කර ඇත. ඒ අනුව 2003-12-31 දින හෝ ඊට පෙර දිනක සිට වලංගු වන සේ අභ්‍යන්තර උපාධියක් ලබා ගෙන තිබේ නම් එසේ උපාධිය ලබා ඇති ගුරුවරුන් සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබ ඇති උපදෙස් අනුව එබඳු අය සඳහාද ශ්‍රී ලංකා ගුරු සේවයේ අදාළ ශ්‍රේණියෙහි පිහිටුවීමට කටයුතු කළ යුතුය. කෙසේ වෙතත් මෙම උපාධි වැටුප් සකස් කිරීමේදී අධ්‍යාපන සේවා කමිටුව විසින් නිකුත් කරනු ලැබ ඇති චක්‍රලේඛ අංක 2001/12 හි 3 ඡේදයෙහි 111 අනුව කටයුතු කළ යුතුය.

05. අභ්‍යන්තර ශිෂ්‍යයන් ලෙස විද්‍යාපීඨ තුල හෝ ගුරු විද්‍යාල වල පුහුණුවලැබූ කාලය තුල උපාධි ලැබූවන් සඳහා මෙම චක්‍රලේඛ විධිවිධාන අදාල නොවේ.

06. මෙම චක්‍රලේඛයේ අංක 04 න් දී ඇති උපදෙස් 2003-12-31 දින හෝ ඊට පෙර දිනෙක සිට වලංගු වනසේ අභ්‍යන්තර උපාධියක් ලබා ඇති ගුරුවරුන්ට පමණක් අදාළ වන අතර ඉන් ඉදිරියට කිසිම හේතුවක් නිසාවත් එම විධිවිධාන දීර්ඝ කරනු නොලැබේ. ඒ නිසා සුදුසුකම් සපුරන සියලුම ගුරුවරුන් සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛ විධිවිධාන නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට අදාළ බලධාරීන් කටයුතු කළ යුතුය.

වෛද්‍ය ටාරා ද මැල්
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:-

1. ලේකම් - රාජ්‍ය සේවා කොමිෂන් සභාව
2. සියලු පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
3. සියලු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
4. සියලු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. ..........................................

මගේ අංකය / எமது இல. / My No. ඊඩී/02/29/04/01/47

දිනය / திகதி / Date 2004.11.30

පළාත් අධ්‍යාපන ලේකම්
පළාත් අධ්‍යාපන අමාත්‍යංශය
බස්නාහිර. ඌව. සබරගමුව. දකුණු.
උතුරු මැද. උතුරු නැගෙනහිර.වයඹ. මධ්‍යම පළාත.

**<u>රජයේ පාස ල්වල ස්වේච්ඡාවෙන් ඉගැන්වීමේ කාර්යයෙහි නිරත වී සිටින්නන් අතුරින් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් මූලික සුදුසුකම් සපුරාලන්නන් පත්කිරීමේ විශේෂ කොන්දේසිවලට යටත්ව ගුරු සේවයට බඳවා ගැනීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා පහත කොන්දේසිවලට යටත්ව ගුරු සේවයට බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇත.

1.1 සියලු පත්කිරීම් අධ්‍යාපන අමාත්‍යංශ චක්‍රලේඛ අංක 98/47 හා 1998.12.11 දිනැති චක්‍රලේඛයට අදාළ පාසල් වර්ගීකරණය යටතේ දුෂ්කර හෝ අතිදුෂ්කර හෝ වශයෙන් නම් කරනු ලබන පාසල් සඳහා පමණක් විය යුතු ය.

1.2 මෙම ඕනෑම පත්වීමක් ඉහත 1.1 සඳහන් පාසල් අතුරින් නිත්‍ය පාසලක එනම් තමා ස්වේච්ඡාවෙන් සේවය කරන පාසලෙහිම සේවය කිරීම සඳහා පමණක් වලංගු වන සේ විය යුතු ය.

1.3 එලෙස පත්වීමට ඉල්ලුම් කරනු ලබන පාසලෙහි 2004.01.01 දිනට අඛණ්ඩ වසර 03ක සේවා කාලයක් සැපිරෙන පරිදි ඉල්ලුම්කරු මේ දක්වා අඛණ්ඩ ව ස්වේච්ඡාවෙන් සේවය කරමින් සිටිය යුතු අතර මෙම කාලය තුළ ස්වේච්ඡාවෙන් කරනු ලැබූ සේවය සඳහා කිසියම් දීමනාවක් නොලබා තිබිය යුතු ය. තවද මෙම තත්ත්වයන් අදාළ පළාත් අධිකාරීන් විසින් සහතික කරනු ලැබීමෙන් අනතුරුව අමාත්‍යංශය විසින් ද තහවුරු කරනු ලැබිය යුතු ය.

1.4 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි විශ්ව විද්‍යාලයකට ඇතුළත් වීම සඳහා සුදුසුකම් සහිත ව අ.පො.ස.(උ.පෙළ) විභාගය සමත් ව සිටීම සහ අවම වයස අවුරුදු 18 සහ උපරිම වයස අවුරුදු 45 වීම යන මූලික සුදුසුකම් සපුරාලිය යුතු ය. මෙම සුදුසුකම් සපුරාලන්නන් ඉගැන්වීම කරනු ලබන පාසලෙහි ඉගැන්වීමේ නිරත වූ විෂයයට යටතේ දැනට ගුරු පුරප්පාඩුවක් පැවතිය යුතු වේ.

1.5 තවද පත්වීම් ලාභියා විසින් එම පත්වීම ස්ථිර කිරීමට පෙර අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන අර්ධ කාලීන අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කළ යුතු ය. මෙම වෘත්තීය සංවර්ධන පාඨමාලා ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හි පැවැත්වෙනු ඇත.

2) දැනට ඔබ පළාතේ රජයේ පාසල්වල ස්වේච්ඡාවෙන් ඉගැන්වීමේ කාර්යයේ නිරත ව සිටින්නන් අතුරින් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ මූලික සුදුසුකම් සපුරාලන ඉහත කොන්දේසිවලට යටත් ව බඳවා ගත හැකි පිරිස පමණක් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පංතියේ 11 ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා කටයුතු කිරීම ඔබට පවරමි.

3) එසේ බඳවාගන්නන් පිළිබඳ සියලු තොරතුරු මා වෙත දන්වා එවිය යුතු ය.

4) ඉහත කොන්දේසිවලට යටත් ව බඳවා ගත නොහැකි සෙසු පිරිස තව දුරටත් පාසල්වල ස්වේච්ඡාවෙන් හෝ ඉගැන්වීමේ කාර්යයේ නිරත නොවිය යුත්තන් සේ සලකා රජය මගින් ප්‍රකාශිත අධ්‍යාපන පොදු සහතික පත්‍ර උ.පෙළ හා සා.පෙළ සමතුන්ට රැකියා අවස්ථා ලබාදීමේ වැඩසටහනේදී ප්‍රමුඛතාව ලබා දීම පිණිස එම වැඩසටහනට අදාළ අමාත්‍යාංශ වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය.

අත්/කළේ
වෛද්‍ය ටාරා ද මැල්
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය.

එස්.එල්.ගුණවර්ධන
අතිරේක ලේකම්
(අධ්‍යාපන සේවා ආයතන)

පිටපත් :- 1 ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව - දැ.ගැ.ස.

2 ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර,මධ්‍යම, ඌව, සබරගමුව,දකුණු
උතුරු මැද, උතුරු නැගෙනහිර, වයඹ, පළාත -